# පුරාවිද්‍යා ස්මාරක සංරක්ෂණය සම්බන්ධව ශ්‍රී ලංකාවේ ස්ථාපිත නීතිමය තත්ත්වය

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

*ලක්මිණි දේශිකා මුණසිංහ*[1]

සංක්ෂේපය

පුරාවිද්‍යා විෂය යන්නෙන් ද්‍රව්‍යමය සාධක ආශ්‍රයෙන් මානවයාගේ අතීතය අධ්‍යනය කිරීම දක්විය හැකිය. පුරාවිද්‍යා විෂය තුළ වඩාත් වැදගත් ස්ථානයක් '' ස්මාරක '' යන්නට හිමි වේ. ස්මාරකයක් යනුවෙන් අදහස් වන්නේ මිනිස් සන්තතියේ පණිවිඩයක් රැගෙන ඔවුන්ගේ පෞරාණික සම්ප්‍රදායයන් සජීවීව දක්වන ලබන සාධකයන් වේ. ස්මාරකයන් නිශ්පාදනය කරනු ලබන අවස්ථාවේ සිටම විනාශ මුඛය කරා ළඟා වෙමින් පවතී. මෙකී හායකාරක තත්ත්වයන් අවම කිරීමට අභ්‍යන්තර හා බාහිර වශයෙන් සිදු කරනු ලබන ප්‍රතිකාරයන් සංරක්ෂණය වේ. මෙම අධ්‍යනයේ ප්‍රධාන අරමුණ වන්නේ පුරාවිද්‍යා ස්මාරක සංරක්ෂණය සම්බන්ධව ශ්‍රී ලංකාවේ ස්ථාපිත නීතිමය ත්ත්ත්වය පිළිබදවත් එම නීතිමය තත්ත්වය ශ්‍රී ලංකාවේ ස්මරක සංරක්ෂණය කිරීමෙහිලා පවතින උපයෝග්‍යතාවය පරීක්ෂා කිරීම පිළිබඳවත්ය. ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා විෂය තුළ ස්ථාපිතව පවතින පනත් ඇසුරින් මෙම අධ්‍යනය සිදු කරන ලදී .

පුරාවිද්‍යා ස්මාරක සංරක්ෂණයහිලා 1940 අංක 9 දරණ පුරාවිද්‍යා ආඥා පනත, ගාලු උරුමය පදනම පනත, 1931 බෞද්ධ විහාරගම් හා දේවාලගම් පනත මෙන්ම විවිධ ප්‍රදේශයන් තුළ නාගරික සංවර්ධන අධිකාරිය මගින් පනවා ඇති නිර්ණායකයන්ද වැදගත් වේ. 1940 අංක 9 දරණ පුරාවිද්‍යා ආඥා පනත අනුව පුරාවිද්‍යා කොමසාරිස් වරයාගේ අවසරය මත ස්මාරක සංරක්ෂණය සම්බන්ධව යම් පුද්ගලයෙකුට අවසර පත්‍රයන් ලබා ගත හැකි අතර කොමසාරිස් වරයා අවසර පත්‍රය ලබා නොදුනහොත් ඒ සම්බන්ධව අවසාන තීරණාත්මක බලය අමාත්‍යවරයාට ගත හැකි වේ. 1998 පුරාවිද්‍යා සංශෝධන පනත ප්‍රකාරවද ආණ්ඩුව විසින් හෝ වෙනත් පුද්ගලයෙකු විසින් යෝජිත සංවර්ධිත හෝ කාර්මික මෙන්ම වෙනත් ව්‍යාපෘති මගින් බලපෑමක් සිදුවිය හැකි ස්මාරකයන් සම්බන්ධයෙන් වන සංරක්ෂණ කටයුතු එම පුද්ගලයාගේ වියදමින් සිදුකළ යුතු වේ. 1994 අංක 7 දරණ ගාලු උරුමය පදනම පනත අනුව ගාලු කොටුව තුළ පවතින ස්මාරකයන් සම්බන්ධයෙන් එම පදනම මගින් නිර්ණාකයන් සම්පාදනය කළ යුතු වේ. මහනුවර ලෝක උරුම නගරය සංරක්ෂණය කිරීම සඳහා පනවා ඇති නිර්ණායකයන් යටතේදී එකී ස්මාරකයන් 'ල ඊලකලඃ යනුවෙන් ශ්‍රේණිගත කොට තිබෙන අතර ස්මාරකයන් සංරක්ෂණයේදී එකී ශ්‍රේණි වලට අයත් නිර්ණායකයන් ගුරුකොට ගත යුතු වේ. බෞද්ධ විහාරගම් හා දේවාලගම් පනත ප්‍රකාරව ඓතිහාසික පුරාවිද්‍යානුගත හෝ චිත්‍රශිල්පානුගත අගයන් තිබෙන බෞද්ධ සිද්ධස්ථානවල සංරක්ෂණ කටයුතු සඳහා ව්‍යවස්ථා සම්පාදනය කිරීමේ බලය අමාත්‍යවරයා සතු වේ.

පුරාවිද්‍යා ස්මාරක සංරක්ෂණය සම්බන්ධව ශ්‍රී ලංකාවේ ස්ථාපිත නීතිමය තත්ත්වය නිරීක්ෂණය කිරීමේදී ස්මාරක සංරක්ෂණයේදී පුද්ගල ජීවිතයකට හානි සිදුවුවහොත් ජීවිත හානිය සම්බන්ධව අදාළ වන නීතිමය තත්ත්වයක් දකිය නොහැකි අතර දේශපාලන අධිකාරියේ වාසි තහවුරුකොට ගෙන අමාත්‍යවරයාට සංරක්ෂණය සදහා පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් ප්‍රතික්ශේපිත අයදුම්පත් සම්බන්ධයෙන් අවසන් තීරණාත්මක බලය අමාත්‍යවරයා සතුව පවතී. උරුම නගරයන් ආශ්‍රිතව තිබෙන පෞද්ගලික ස්මාරකයන් රජයේ වියදමින් සංරක්ෂණය කොට අවසන් වූ පසුව පෞද්ගලික හිමිකාරීත්වය විසින් එම ස්මාරකයන් වැඩි මුදලකට විකුණනු ලබයි. මෙකී තත්ත්වයන් පාලනය කළ නොහැකි නීතිමය තත්ත්වයක් ශ්‍රී ලංකාවේ දකිය හැකි නොවේ.

පවතින අවශ්‍යතාවයන්ට සාපේක්ෂව පුරාවිද්‍යා ස්මාරක සංරක්ෂණය සම්බන්ධව ශ්‍රී ලංකාවේ තිබෙන නීතිමය තත්ත්වයන් සංශෝධනය කළ යුතු අතර නව නීතිමය තත්ත්වයන් හඳුන්වාදිය යුතු වේ.

Keywords: Chronic Kidney Disease, Sri Lanka, Economic and Social Vulnerability

1 පුරාවිද්‍යා අධ්‍යන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, deshikamunasingha@gmail.com